ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ උධ්‍යයන උපාධි පාඨමාලාව – සිව්වන මට්ටම
අවසාන පරීක්ෂණය – 2007/2008
සාර්ව ආර්ථික විද්‍යාව – MCU 2207

**කාලය : පැය තුනයි**

දිනය: 03.02.2008 වේලාව : පෙ. ව. 9.30 – ප.ව 12.30

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු ලියන්න.**

1 සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ වෙනස්වීම් ව්‍යාපාර තීරණ ගැනීමේදී බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 20)

2 (i) පරිභෝජන ශ්‍රිතය යනු කුමක්ද? $C = a + bY$ යන සමීකරණයෙහි a, b සහ Y සඳහා කල්පිත අගයන් අනුමාන කරමින් පරිභෝජන වක්‍රය නිර්මාණය කරන්න. (ලකුණු 5)

(ii) ඉහත දී ඇති පරිභෝජන ශ්‍රිතය ඇසුරින් ඉතුරුම් ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 2)

(iii) එක්තරා ආර්ථිකයකට අදාළ පහත තොරතුරු සලකන්න.

$$C = 50 + 0.8Y_d$$
$$I = 100$$
$$G = 50$$
$$T = 30 + 0.2Y$$

පහත දෑ ගණනය කරන්න.

(අ) ජාතික ආදායමේ සමතුලිත මට්ටම
(ආ) වියදම් ගුණකය
(ඇ) ආන්තික ඉතුරුම් නැඹියාව (MPS) 0.3 නම්, නව ජාතික ආදායම (ලකුණු 13)

3. (i) IS වක්‍රයෙහි බෑවුමෙහි විශාලත්වය තීරණය වන්නා වූ සාධක මොනවාද? ප්‍රස්ථාර ඇසුරින් ඔබේ පිළිතුර පහදන්න. (ලකුණු 10)

(ii) "ද්‍රවශීලතා උගුලේදී, පොලී අනුපාතිකය සඳහා බලපෑම් කිරීමට තරම් මූල්‍ය ප්‍රතිපත්තියක් ශක්තිමත් නොවන්නේය," මෙම ප්‍රකාශය ප්‍රස්ථාර ඇසුරින් පැහැදිල කරන්න. (ලකුණු 10)

4. (i) වාණිජ බැංකුවල මුදල් මැවීමේ කාර්යය සඳහා පවතින සීමාවන් කවරේද? (ලකුණු 10)

(ii) "මුදල් ප්‍රමාණ න්‍යායෙහි (Simple Quantity Theory) අනුමාන කිරීමේ ශක්තිය දුර්වලයි". පහදන්න. (ලකුණු 10)

5. "පසුගිය වකවානුවෙහි ශ්‍රී ලංකාව තුළ සාමාන්‍ය මිල මට්ටම්වල ඉහළ යෑම සඳහා විවධාකාර හේතු සාධකයන් බලපෑම් කර ඇත," උද්ධමන පිළිබඳ විවිධ න්‍යායන් උපයෝගී කර ගනිමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 20)

6. (i) ව්‍යාපාර චක්‍රය යනු කුමක්ද? ව්‍යාපාර චක්‍රයේ විවිධ අවධීන් මොනවාද? මෙම විවිධ අවධීන් ව්‍යාපාර ක්‍රියාකාරිත්වය සඳහා කෙසේ බලපායිද? පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ආර්ථිකයෙහි චක්‍රිය උච්චාවචනයන් පාලනය කිරීම සඳහා රජය මූල්‍ය සහ පිස්කල් ප්‍රතිපත්තීන් යොදා ගන්නේ කෙසේදැයි පහදන්න. (ලකුණු 10)

7. පහත මාතෘකා අතුරින් හතරක් (04) තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) ආරෝපණය
(ii) නාමික සහ මූර්ත මුදල් සැපයුම
(iii) වාර සේවා වියුක්තිය (Seasonal Unemployment)
(iv) ආර්ථික වෘද්ධියෙහි නිර්නායක
(v) මුදල් ළඟ තබා ගැනීම සඳහා වන චේතනා (Motives for Holding Money)

(ලකුණු 5 x 4)

– හිමිකම් ඇවිරිණි –